කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு

MINISTRY OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT

කාර්මික සංවර්ධන මණ්ඩලය

කාර්ය සාධන විශ්ලේෂණ වාර්තාව

සැලසුම් අංශය - 2026

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

1. හැඳින්වීම

1.1 ආයතනය පිළිබඳ කෙටි හැඳින්වීම

1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත යටතේ ස්ථාපිත කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB), ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම සඳහා වගකීම දරන ප්‍රධාන ව්‍යවස්ථාපිත ආයතනයකි. කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම ආයතනය මඟින් නව ව්‍යවසායකයින් සහ කර්මාන්ත සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම, ව්‍යාපාර සංවර්ධනය, යටිතල පහසුකම්, පුහුණු සහ උපදේශන සේවා ලබාදීම සඳහා මැදිහත්ව කටයුතු කරනු ලැබේ. කාර්මික සංවර්ධන මණ්ඩලය අතීතයේ සිට ප්‍රධාන වශයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කළ අතර, වර්තමානය වන විට කර්මාන්ත අතර තරඟකාරීත්වය, ඵලදායිතාව, නවෝත්පාදනය, අගය එකතු කිරීම, නවීන තාක්ෂණය භාවිතයට ගැනීම සහ වෙළඳපොළ ප්‍රවේශය ශක්තිමත් කිරීම සඳහා මැදිහත් වෙමින් පුළුල් භූමිකාවක් ඉටු කරන ආයතනයක් ලෙස විකාශනය වී ඇත. තවද දිවයින පුරා ව්‍යාප්තව පවතින දිස්ත්‍රික් කාර්යාල හා කාර්මික ජනපද ජාලයන් වෙත තාක්ෂණික පහසුකම් සහ විශේෂිත සේවාවන් සැපයීම මඟින්, නවෝත්පාදන මූලික කරගත්, අපනයන නැඹුරු සහ පරිසර හිතකාමී තිරසාර කාර්මික අංශයක් සංවර්ධනය කිරීමට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය දායක වේ. එමෙන්ම, දේශීය ව්‍යවසායන්ගේ වර්ධනය හා කර්මාන්ත ක්ෂේත්‍රයේ පරිවර්තනයට සහාය ලබාදීමත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ කර්මාන්තකරුවන්ගේ තරඟකාරීත්වය වැඩිදියුණු කිරීමත් සඳහා මෙම ආයතනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

දැක්ම

"සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත සංවර්ධනය කිරීම"

මෙහෙවර

"ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායික, තාක්ෂණික හා වාණිජමය පදනම සකසා දීම"

කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් කර්මාන්ත සඳහා සපයනු ලබන ප්‍රධාන සේවා හා පහසුකම්

- කළමනාකරණ පුහුණුව, අලෙවිකරණ සහාය, ව්‍යවසායකත්ව සංවර්ධන සේවා සහ උපදේශන සේවා කර්මාන්තකරුවන් හා ව්‍යවසායකයන් වෙත ලබා දීම.
- කර්මාන්තකරුවන්, සේවාලාභීන් සහ IDB කාර්ය මණ්ඩලය වෙත කාර්මික තොරතුරු සහ දැනුම ප්‍රචාරණය හා බෙදාහැරීම.
- SMEs සහ විභව ව්‍යවසායකයන් දැනුවත් කිරීම සඳහා නැගී එන සහ ප්‍රමුඛතා ව්‍යාපාරික ක්ෂේත්‍ර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- තාක්ෂණික සේවා සැපයීම සහ වාත්තු කර්මාන්ත පහසුකම් සංවර්ධනය කිරීම මඟින් දේශීය ලෝහ කර්මාන්තය සඳහා ලෝහ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමට සහ ලෝහ ආනයන අවම කිරීමට සහාය වීම.
- අදාළ ආයතන වෙතින් අරමුදල් සහ අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම.
- රබර් කර්මාන්ත ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවන් සඳහා නිෂ්පාදන සංවර්ධන, පරීක්ෂණ, ව්‍යාප්ති සහ උපදේශන සේවා සැපයීම.
- සම් නිෂ්පාදන සහ පාවහන් කර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සහ සහාය ලබා දීම.
- කර්මාන්ත සඳහා ඉංජිනේරු සේවා සහ ලෝහ විද්‍යාත්මක පරීක්ෂණ සේවා සැපයීම.
- මෝටර් රථ කර්මාන්තය සහ සංරචක නිෂ්පාදන කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා සහාය ලබා දීම.
- CNC යන්ත්‍රෝපකරණ සේවා සහ වැඩමුළු පහසුකම් කර්මාන්ත සඳහා සැපයීම.
- කාර්මික පිරිසැලසුම් (Industrial Layout), කාර්මික පහසුකම් සැලසුම්කරණය (Industrial Facility Design) සහ කර්මාන්ත යටිතල පහසුකම් සංවර්ධන සේවා සැපයීම.

1.2 ඉදිරි ඉලක්ක

- ව්‍යාපාර කිරීමේ පහසුව (Ease of Doing Business) සම්බන්ධ ශ්‍රේණිගත කිරීම 99 වන ස්ථානයේ සිට 2030 වන විට 50ට අඩු මට්ටමකට වැඩිදියුණු කිරීම.
- ව්‍යවසායකත්ව අනුපාතය සහ නව කර්මාන්ත ස්ථාපිත කිරීම ඉහළ නැංවීම, වර්තමාන 2.8% සිට 2030 වන විට 10% දක්වා වර්ධනය කිරීම.
- දළ දේශීය නිෂ්පාදිතයට (GDP) නිෂ්පාදන කර්මාන්ත අංශයේ දායකත්වය වර්තමාන 15% සිට 2030 වන විට 25% දක්වා ඉහළ නැංවීම සඳහා නව සහ පවතින කර්මාන්තවල ස්ථාවර හා තිරසාර වර්ධනය ප්‍රවර්ධනය කිරීම.
- පුද්ගලයෙකුට හිමි වාර්ෂික අපනයන වටිනාකම වර්තමාන ඇමරිකානු ඩොලර් 596 සිට 2030 වන විට ඇමරිකානු ඩොලර් 1,527 දක්වා ඉහළ නැංවීම, එනම් ගෝලීය සාමාන්‍යය වන ඇමරිකානු ඩොලර් 3,055කින් 50%ක මට්ටමකට ළඟා වීම.
- කාර්මික කලාප සඳහා වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණයේ ප්‍රතිශතය වර්තමාන 0.04% සිට 2030 වන විට 1% දක්වා ඉහළ නැංවීම.
- කර්මාන්ත අංශයේ හරිතාගාර වායු (GHG) විමෝචනය, සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වන තත්ත්වය (Business as Usual – BAU) හා සැසඳීමේදී, සම්පත් කාර්යක්ෂමතාව, හරිත තාක්ෂණය සහ චක්‍රාකාර ආර්ථික සංකල්ප අනුගමනය කරමින් සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම මඟින් 2030 වන විට 7%කින් අඩු කිරීම.

1.3 අභියෝග

- **දුර්වල ජාත්‍යන්තර වෙළඳපොළ සම්බන්ධතා සහ අපනයන සබඳතා පැවතීම**

ශ්‍රී ලාංකීය කර්මාන්ත, විශේෂයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs), ජාත්‍යන්තර වෙළඳපොළ හා ගෝලීය අගය දාමයන්ට සම්බන්ධ වීම තවමත් සීමිත මට්ටමක පවතී. දුර්වල අපනයන සබඳතා, සීමිත වෙළඳපොළ තොරතුරු, ජාත්‍යන්තර ව්‍යාපාරික ජාලවල අඩු ප්‍රවේශය සහ අදාළ ආයතන අතර ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් නොමැති වීම හේතුවෙන් අපනයන අවස්ථා හඳුනාගෙන තිරසාර ලෙස පවත්වාගෙන යාමට බාධා ඇති වේ. තවද, පැහැදිලි අපනයන කාර්යසාධන දර්ශක සහ ක්‍රමානුකූල අධීක්ෂණ යාන්ත්‍රණ නොමැති වීම ජාත්‍යන්තර වෙළඳපොළ පුළුල් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගවල කාර්යක්ෂමතාව සීමා කරයි.

- **තාක්ෂණික නවීකරණයේ මන්දගාමීත්වය සහ සීමිත නවෝත්පාදන ධාරිතාව**

දේශීය කර්මාන්ත බොහොමයක් තවමත් යල්පැන ගිය තාක්ෂණයන්, යන්ත්‍රෝපකරණ සහ නිෂ්පාදන ක්‍රියාවලීන් භාවිත කිරීම හේතුවෙන් ඵලදායිතාව, ගුණාත්මකභාවය, කාර්යක්ෂමතාව සහ තරඟකාරීත්වය සීමා වී ඇත. උසස් තාක්ෂණයන්, පර්යේෂණ හා සංවර්ධන පහසුකම්, නිෂ්පාදන නවෝත්පාදන සහ තාක්ෂණ හුවමාරු අවස්ථා සඳහා සීමිත ප්‍රවේශය හේතුවෙන් කර්මාන්තවල අගය එකතු කිරීමේ හැකියාවද අඩු වී ඇත. එමෙන්ම, ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලීම සහ ගෝලීය වෙළඳපොළ තුළ තරඟකාරී වීම සඳහා දේශීය ව්‍යවසායන්ගේ හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

- **අපනයන ප්‍රවර්ධන හා වෙළඳ පහසුකරණ පද්ධතියේ (Trade Facilitation Ecosystem) පවතින හිඩැස්**

පවතින ආයතනික හා ප්‍රතිපත්තිමය පරිසරය අපනයන වෙළඳපොළ වෙත ව්‍යාප්ත වීමට අපේක්ෂා කරන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ප්‍රමාණවත් සහයෝගයක් සැමවිටම ලබා නොදේ. සීමිත වෙළඳ හා ආර්ථික හවුල්කාරිත්වයන්, සංකීර්ණ නියාමන ක්‍රියාපටිපාටි සහ ආයතනික සහයෝගයේ ඛණ්ඩිතභාවය අපනයන-නැඹුරු වර්ධනයට බාධාවක් වේ. එබැවින් වෙළඳ පහසුකරණය, ආයතනික සම්බන්ධීකරණය, වෙළඳපොළ තොරතුරු වෙත ප්‍රවේශය සහ උපායමාර්ගික හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ.

- **සංවර්ධනය සහ කාර්මික පරිවර්තනය සඳහා සීමිත මූල්‍ය ධාරිතාව**

සංවර්ධන වැඩසටහන් සහ කාර්මික නවීකරණ මුලපිරීම් ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය සීමාවන් සැලකිය යුතු අභියෝගයක් ලෙස පවතී. සංවර්ධන කටයුතු සඳහා වෙන් කළ මූල්‍ය සම්පත් ඇතැම් අවස්ථාවල පුනරාවර්තන වියදම් සඳහා යොමු කිරීමට සිදුවීම හේතුවෙන් උපායමාර්ගික ආයෝජන සඳහා පවතින අරමුදල් සීමා වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස තාක්ෂණික නවීකරණය, යටිතල පහසුකම් සංවර්ධනය, නවෝත්පාදන වැඩසටහන් සහ මතුවෙමින් පවතින කාර්මික අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීමේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය ධාරිතාව සීමා වී ඇත.

- **කාර්මික ඉඩම් සංවර්ධනය සහ යටිතල පහසුකම් පුළුල් කිරීමේ සීමාවන්**

මෙරට කර්මාන්ත ක්ෂේත්‍රයේ ව්‍යාප්තිය සඳහා සුදුසු ඉඩම් සහ අවශ්‍ය යටිතල පහසුකම් ලබාගැනීමේ සීමාවන් සැලකිය යුතු අභියෝගයක් ලෙස පවතී. ඉඩම් අත්පත් කරගැනීම හා සංවර්ධනය කිරීම සම්බන්ධ දිගු නීතිමය හා පරිපාලන ක්‍රියාපටිපාටි හේතුවෙන් නව කාර්මික කලාප ස්ථාපිත කිරීම ප්‍රමාද වේ. තවද, කාර්මික ආයෝජන සඳහා සුදුසු ඉඩම් හඳුනාගැනීම, සැලසුම් කිරීම සහ කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගැනීම සඳහා ඩිජිටල් කාර්මික ඉඩම් බැංකුවක් වැනි ඒකාබද්ධ යාන්ත්‍රණයක් නොමැති වීම කාර්මික ඉඩම් සංවර්ධනය සහ නව ආයෝජන පුළුල් කිරීමට බාධාවක් වේ.

- **කාර්මික සංවර්ධන මණ්ඩලය තුළ මානව සම්පත් ධාරිතාවයේ සීමාවන්**

ප්‍රමාණවත් සුදුසුකම් සහිත තාක්ෂණික, වෘත්තීය, කළමනාකරණ හා ක්ෂේත්‍ර මට්ටමේ කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් කාර්මික සංවර්ධන මණ්ඩලය මානව සම්පත් ධාරිතා සීමාවන්ට මුහුණ දෙයි. මෙම තත්ත්වය සංවර්ධන වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, විශේෂිත තාක්ෂණික හා උපදේශන සේවා සැපයීම, කාර්මික ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ කර්මාන්තවල වෙනස්වන අවශ්‍යතාවලට කාලෝචිතව ප්‍රතිචාර දැක්වීම සීමා කරයි. එබැවින් ආයතනයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සේවා සැපයීමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා මානව සම්පත් ධාරිතාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ.

- **කුසලතා සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා ප්‍රමාණවත් ආයෝජන නොමැති වීම**

කාර්මික පරිවර්තනය සාක්ෂාත් කර ගැනීම සඳහා නිපුණතා සහිත තාක්ෂණික, කළමනාකරණ සහ ව්‍යවසායකත්ව මානව සම්පතක් පැවතීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත්, පුහුණු වැඩසටහන්, වෘත්තීය සංවර්ධනය සහ ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් සිදු නොවීම හේතුවෙන් තාක්ෂණය භාවිතයට ගැනීම, නවෝත්පාදනය, ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ නවීන කාර්මික කළමනාකරණය සඳහා අවශ්‍ය කුසලතා සංවර්ධනය කිරීම සීමා වී ඇත. එබැවින්, තරඟකාරී, දැනුම මත පදනම් වූ සහ තාක්ෂණයෙන් මෙහෙයවෙන කාර්මික ක්ෂේත්‍රයකට සහාය විය හැකි නිපුණ ශ්‍රම බලකායක් ගොඩනැඟීම සඳහා මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා වැඩි ආයෝජනයක් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ.

2) ප්‍රගතිය

2.1 ආදායම් ප්‍රකාශ විශ්ලේෂණය

2.1.1 වගුව : ආදායම් ප්‍රකාශය

	2021	2022	2023	2024 (සංශෝධිත)	2025
ආදායම	394,565,726	513,989,237	544,248,359	595,763,280	610,327,831
විකුණුම් සහ සේවා පිරිවැය	(278,614,556)	(322,580,951)	(358,869,304)	(435,906,373)	(407,358,169)
දළ ලාභය	**115,951,170**	**191,408,285**	**185,379,056**	**159,856,907**	**202,969,662**
පොලී අදායම	5,812,667	14,955,664	24,622,036	16,110,862	10,787,748
අනෙකුත් ආදායම්	106,106,069	169,466,895	282,321,681	352,824,195	259,807,850
රජයේ පුනරාවර්තන දීමනාව	465,750,000	505,400,000	598,195,000	500,000,000	500,000,000
පරිපාලන වියදම්	(624,810,763)	(694,238,619)	(732,020,710)	(837,522,637)	(873,042,414)
විකුණුම් බෙදාහැරීමේ වියදම්	(8,902,791)	(59,189,699)	(340,618,701)	(251,169,061)	(97,160,515)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල	59,906,352	127,802,526	17,878,362	(59,899,734)	3,362,332
මූල්‍ය පිරිවැය	(588,050)	(1,070,001)	(1,281,878)	(1,543,825)	(1,243,493)
බදු වලට පෙර ශුද්ධ ආදායම/(අලාභය)	59,318,302	126,732,525	16,596,485	(61,443,559)	2,118,839
බදු අදායම	-	-	-	-	(635,652)
බදු වලට පසු ශුද්ධ ආදායම/(අලාභය)	-	-	-	(61,443,559)	1,483,187
වෙනත් විස්තීර්ණ ආදායම්	15,123,409	15,052,636	11,768,860	(21,568,123)	22,339,146
වර්ෂය සඳහා ශුද්ධ ආදායම /(අලාභය)	**74,441,711**	**141,785,161**	**28,365,345**	**(83,011,682)**	**23,822,333**
දළ ආන්තිකය අනුපාතය	0.293	0.372	0.341	0.268	0.332

2.1.1 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ විශ්ලේෂණය (2021–2025)

2021–2025 කාලපරිච්ඡේදය තුළ කාර්මික සංවර්ධන මණ්ඩලයේ (IDB) මූල්‍ය කාර්යසාධනය විශ්ලේෂණය කිරීමේදී, සමස්ත මූල්‍ය ප්‍රතිඵලවල යම් යම් උච්චාවචනයන් පැවතියද, ආදායම සහ දළ ලාභය සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් වර්ධනය වන ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. ආදායම 2021 වර්ෂයේ රු. මි. 394.57 සිට 2025 වර්ෂයේ රු. මි. 610.33 දක්වා ඉහළ ගොස් ඇති අතර, දළ ලාභය රු. මි. 115.95 සිට රු. මි. 202.97 දක්වා වර්ධනය වී ඇත. එමෙන්ම, මෙම කාලපරිච්ඡේදය තුළ දළ ලාභ ආන්තිකය 29.3% සිට 33.2% දක්වා වැඩිදියුණු වී ඇත. කෙසේ වෙතත්, පරිපාලන වියදම් අඛණ්ඩව ඉහළ යාම සහ විකුණුම් හා බෙදාහැරීමේ වියදම්වල සිදුවූ උච්චාවචනයන් මෙහෙයුම් කාර්යසාධනය කෙරෙහි සැලකිය යුතු පීඩනයක් ඇති කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2024 වර්ෂයේදී රු. මි. 83.01ක ශුද්ධ අලාභයක් වාර්තා කර ඇත. 2025 වර්ෂයේදී, විකුණුම් හා බෙදාහැරීමේ වියදම් රු. මි. 251.17 සිට රු. මි. 97.16 දක්වා සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් මූල්‍ය තත්ත්වය සැලකිය යුතු ලෙස වැඩිදියුණු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, මණ්ඩලය රු. මි. 3.36ක මෙහෙයුම් ලාභයක් සහ රු. මි. 23.82ක ශුද්ධ ලාභයක් වාර්තා කිරීමට සමත් වී ඇත.

එසේ වුවද, පරිපාලන වියදම් අඛණ්ඩව ඉහළ යාම සහ රජයේ පුනරාවර්තන ප්‍රදාන මත රඳා පැවතීම මඟින් පිරිවැය කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කිරීම, ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ කාර්මික සංවර්ධනය සඳහා මණ්ඩලයට පැවරී ඇති දිගුකාලීන වගකීම් ඵලදායීව ඉටු කිරීම සඳහා එහි මූල්‍ය තිරසාරභාවය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරයි.

ප්‍රස්ථාරය 2.1.1 : 2021–2025 කාලය සඳහා ආදායම, විකුණුම් පිරිවැය, දළ ලාභය සහ ශුද්ධ ලාභය (රු. මිලියන)



ප්‍රස්ථාරය මඟින් පෙන්නුම් කරන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ (IDB) ආදායම 2021 වර්ෂයේ රු. මි. 394.57 සිට 2025 වර්ෂයේ රු. මි. 610.33 දක්වා අඛණ්ඩව ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කර ඇති බවයි. එමඟින් මණ්ඩලයේ ආදායම් උත්පාදන ධාරිතාව වැඩිදියුණු වී ඇති බව පිළිබිඹු වේ. දළ ලාභය ද සමස්තයක් ලෙස ඉහළ ගොස් ඇති අතර, 2025 වර්ෂයේදී රු. මි. 202.97ක් දක්වා ළඟා වී ඇත. මෙයට 2024 වර්ෂයට සාපේක්ෂව විකුණුම් පිරිවැය අඩුවීම දායක වී ඇත. කෙසේ වෙතත්, ශුද්ධ මූල්‍ය කාර්යසාධනය සැලකිය යුතු ලෙස උච්චාවචනය වී ඇති අතර, 2024 වර්ෂයේදී මණ්ඩලය රු. මි. 83.01ක ශුද්ධ අලාභයක් වාර්තා කර ඇති අතර, 2025 වර්ෂයේදී එය රු. මි. 23.82ක ශුද්ධ ලාභයක් දක්වා යළි වර්ධනය වී ඇත. සමස්තයක් ලෙස, 2025 වර්ෂයේදී මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධනයේ සැලකිය යුතු වැඩිදියුණුවක් පෙන්නුම් කරන අතරම, ඵලදායී පිරිවැය කළමනාකරණයක් සහ තිරසාර ආදායම් උත්පාදනය තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව ද මෙම ප්‍රවණතාව මඟින් අවධාරණය කරයි.

2.2 මූල්‍ය තත්ත්වය විශ්ලේෂණය

වගුව 2.2.1 : ශේෂ පත්‍රය

	2021	2022	2023	2024 (සංශෝධිත)	2025
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපල පිරියත සහ උපකරණ	509,254,296	502,155,629	514,399,739	549,484,837	592,200,421
ආයෝජන දේපල	1,115,390,943	1,184,286,002	1,199,665,852	1,184,402,063	1,159,848,332
සිදු වෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු	83,721,066	38,614,504	58,024,100	97,280,201	70,767,682
ස්ථාවර තැන්පතු	84,841,643	-	-	-	-
	1,793,207,948	**1,725,056,135**	**1,772,089,691**	**1,831,167,101**	**1,822,816,436**
ජංගම වත්කම්					
තොගය	25,947,972	46,718,615	78,085,026	96,244,584	141,596,384
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	24,932,232	23,567,675	39,999,292	20,032,889	27,664,459
අනෙකුත් **ජංගම වත්කම්**	48,626,679	45,914,025	57,899,539	89,460,174	76,048,948
තැන්පතු සහ පෙර-ගෙවීම්	88,070,127	78,001,365	126,763,984	102,030,252	174,470,162
ලැබිය යුතු - විශේෂ ව්‍යාපෘති	13,491,040	9,348,448	14,629,625	15,432,465	16,870,507
මුදල් සහ මුදල් සමාන	135,203,479	343,300,457	423,674,387	352,173,230	456,645,073
	336,271,529	546,850,584	741,051,852	**675,373,594**	**893,295,534**
මුළු වත්කම්	**2,129,479,477**	**2,271,906,719**	**2,513,141,544**	**2,506,540,695**	**2,716,111,970**
කොටස් හිමිකාරත්වය සහ වගකීම්					
ප්‍රාග්ධන සහ සංචිත					
විවිධ ප්‍රාග්ධන ප්‍රදානය	304,455,733	258,758,672	314,264,535	463,952,853	611,066,703
ප්‍රාග්ධන සංචිත	6,243,013	6,243,013	6,243,013	6,243,013	6,243,013
මාරු කළ වත්කම්වල වටිනාකම	13,447,061	13,447,061	13,447,061	13,447,061	13,447,061
ස්ථාවර වත්කම් නැවත තක්සේරු කිරීමේදී අතිරික්තය	960,696,321	960,696,320	960,696,320	960,696,320	960,696,320
විවිධ රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන ව්‍යාපෘති	556,582,142	581,577,397	643,854,473	625,761,976	651,514,140
	1,841,424,270	1,820,749,463	1,938,505,402	2,070,101,223	2,242,967,237
රජයේ ප්‍රදාන					
සමුච්චිත අලාභය	(200,739,910)	(60,791,523)	(32,682,441)	(103,016,888)	(79,191,293)
එකතුව	**1,640,684,359**	**1,759,957,940**	**1,905,822,961**	**1,967,084,335**	**2,163,775,944**
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	206,131,395	206,829,087	188,634,080	210,861,836	195,815,898
විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන		661,300	30,630	76,246	76,246
	206,131,395	**207,490,387**	**188,664,709**	**210,938,082**	**195,892,145**
ජංගම වගකීම්					
රජයට ගෙවිය යුතු මුදල්	74,779	54,929	40,994	75,532	75,232
ආයතනයට ගෙවිය යුතු මුදල්	8,196,956	7,759,526	15,060,823	8,454,407	10,369,829
බැංකු ණය ශේෂය	-	-	-	-	-
ප්‍රතිපාදන සහ උපචිත වියදම්	274,391,987	296,643,936	403,552,056	319,988,339	345,998,820
	282,663,722	**304,458,392**	**418,653,873**	**328,518,277**	**356,443,881**
මුළු කොටස් සහ වගකීම්	**2,129,479,477**	**2,271,906,719**	**2,513,141,544**	**2,506,540,695**	**2,716,111,970**
වත්කම් අනුපාතය	**1.19 : 1**	**1.8 : 1**	**1.77 : 1**	**2.06:1**	**2.51:1**
මුදල් අනුපාතය	**0.478**	**1.128**	**1.012**	**1.072**	**1.281**

2021–2025 කාලපරිච්ඡේදය තුළ කාර්මික සංවර්ධන මණ්ඩලයේ (IDB) මූල්‍ය තත්ත්වය විශ්ලේෂණය කිරීමේදී, එහි වත්කම් පදනම, ද්‍රවශීලතාව සහ සමස්ත හිමිකම් තත්ත්වය ක්‍රමානුකූලව ශක්තිමත් වී ඇති බව පෙන්නුම් කරයි. සමස්ත වත්කම් ප්‍රමාණය 2021 වර්ෂයේ රුපියල් බිලියන 2.13 සිට 2025 වර්ෂයේදී රුපියල් බිලියන 2.72 දක්වා ඉහළ ගොස් ඇති අතර, මෙයට ප්‍රධාන වශයෙන් දේපළ, යන්ත්‍රෝපකරණ හා උපකරණ (Property, Plant and Equipment) සහ ජංගම වත්කම්වල වර්ධනය දායක වී ඇත. ජංගම වත්කම් 2021 වර්ෂයේ රු. මි. 336.27 සිට 2025 වර්ෂයේදී රු. මි. 893.30 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. එමෙන්ම, මුදල් සහ මුදල් සමාන දෑ රු. මි. 135.20 සිට රු. මි. 456.65 දක්වා ඉහළ යාම මඟින් මණ්ඩලයේ කෙටි කාලීන ද්‍රවශීලතා තත්ත්වයේ සැලකිය යුතු වැඩිදියුණුවක් පෙන්නුම් කරයි. මෙම තත්ත්වය ජංගම අනුපාතය (Current Ratio) 2021 වර්ෂයේ 1.19:1 සිට 2025 වර්ෂයේදී 2.51:1 දක්වා වැඩිදියුණු වීමෙන් ද පැහැදිලි වේ. එමඟින් මණ්ඩලයට සිය කෙටි කාලීන වගකීම් සපුරාලීමේ හැකියාව වඩාත් ශක්තිමත් වී ඇති බව පෙන්නුම් කරයි. එසේම, මුදල් අනුපාතය (Cash Ratio) 0.478 සිට 1.281 දක්වා ඉහළ ගොස් ඇති අතර, 2025 වර්ෂයේදී මණ්ඩලය සතු මුදල් සහ මුදල් සමාන දෑ මඟින් එහි ජංගම වගකීම් සම්පූර්ණයෙන් ආවරණය කිරීමට ප්‍රමාණවත් හැකියාවක් පැවති බව මෙයින් පෙන්නුම් කරයි.

සමස්ත හිමිකම් (Total Equity) ප්‍රමාණය ද 2021 වර්ෂයේ රුපියල් බිලියන 1.64 සිට 2025 වර්ෂයේදී රුපියල් බිලියන 2.16 දක්වා ඉහළ ගොස් ඇත. මෙයට ප්‍රධාන වශයෙන් කල්දමන ලද ප්‍රාග්ධන ප්‍රදාන (Deferred Capital Grants) සහ ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ලැබුණු රජයේ ප්‍රදාන දායක වී ඇත. එමෙන්ම, සමුච්චිත අලාභය (Accumulated Losses) 2021 වර්ෂයේ රු. මි. 200.74 සිට 2025 වර්ෂයේදී රු. මි. 79.19 දක්වා අඩු වී ඇත. කෙසේ වෙතත්, ජංගම නොවන සහ ජංගම වගකීම් සාපේක්ෂව පාලනය කළ හැකි මට්ටමක පැවතියද, ප්‍රාග්ධන ආයෝජන සඳහා රජයේ ප්‍රාග්ධන ප්‍රදාන මත අඛණ්ඩව රඳා පැවතීම මඟින් අභ්‍යන්තරව උත්පාදනය කරගන්නා මූල්‍ය සම්පත් ශක්තිමත් කිරීමේ සහ මූල්‍ය තිරසාරභාවය වැඩිදියුණු කිරීමේ වැදගත්කම අවධාරණය කරයි. සමස්තයක් ලෙස, 2021–2025 කාලපරිච්ඡේදයේ ප්‍රවණතාව මඟින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරත්වය සහ ද්‍රවශීලතාව වැඩිදියුණු වී ඇති අතර, එහි වත්කම් සහ හිමිකම් පදනම ද ශක්තිමත් වී ඇති බව පෙන්නුම් කරයි. මෙම තත්ත්වය මණ්ඩලයට සිය කාර්මික සංවර්ධන වගකීම් වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වඩාත් හිතකර මූල්‍ය පදනමක් සපයයි.

ප්‍රස්ථාරය 2.2.1: ප්‍රධාන මූල්‍ය කාර්යසාධන දර්ශකවල ප්‍රවණතාවය 2021–2025 (රු. මිලියන)



ප්‍රස්ථාරය මඟින් 2021–2025 කාලපරිච්ඡේදය තුළ කාර්මික සංවර්ධන මණ්ඩලයේ (IDB) මූල්‍ය තත්ත්වය සාමාන්‍යයෙන් ශක්තිමත් වෙමින් පවතින බව පෙන්නුම් කරයි. සමස්ත වත්කම් 2021 වර්ෂයේ ආසන්න වශයෙන් රුපියල් බිලියන 2.13 සිට 2025 වර්ෂයේදී රුපියල් බිලියන 2.72 දක්වා ඉහළ ගොස් ඇති අතර, සමස්ත හිමිකම් 2021 වර්ෂයේ රුපියල් බිලියන 1.64 සිට රුපියල් බිලියන 2.16 දක්වා ඉහළ ගොස් ඇත. මෙය මණ්ඩලයේ සමස්ත වත්කම් සහ හිමිකම් පදනම වර්ධනය වී ඇති බව පිළිබිඹු කරයි. ජංගම වත්කම් ද සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර, 2021 වර්ෂයේ රු. මි. 336.27 සිට 2025 වර්ෂයේදී රු. මි. 893.30 දක්වා වර්ධනය වී ඇත. එයට මුදල් සහ මුදල් සමාන දෑ රු. මි. 135.20 සිට රු. මි. 456.65 දක්වා ඉහළ යාම ප්‍රධාන වශයෙන් දායක වී ඇත. 2024 වර්ෂයේදී නිරීක්ෂණය වූ තාවකාලික පහත වැටීමෙන් අනතුරුව 2025 වර්ෂයේදී සැලකිය යුතු ප්‍රකෘතිමත් වීමක් සිදුවී ඇති අතර, අදාළ ප්‍රධාන දර්ශක හතරම මෙම කාලපරිච්ඡේදය තුළ ඉහළම මට්ටම් කරා ළඟා වී ඇත. සමස්තයක් ලෙස, මෙම ප්‍රවණතාව මඟින් මණ්ඩලයේ ද්‍රවශීලතාව වැඩිදියුණු වී ඇති බවත්, මූල්‍ය ස්ථාවරත්වය ශක්තිමත් වී ඇති බවත්, දැනට ක්‍රියාත්මක කාර්මික සංවර්ධන කටයුතු සහ අනාගත ආයෝජන සඳහා සහාය දැක්වීමේ ධාරිතාව වැඩි වී ඇති බවත් පෙන්නුම් කරයි.

2.3 පසුගිය වසර කිහිපය තුළ කාර්මික ජනපද වලට අදාලව වන කාර්යසාධන විශ්ලේෂණය

වගුව 2.3: කාර්මික ජනපද ප්‍රගතිය

අංක	කාර්මික ජනපද සංවර්ධනය	2023	2024	2025
1	පිහිටුවන ලද කාර්මික ජනපද ගණන	17	19	19
2	වාණිජ නිෂ්පාදනයේ යෙදෙන මුළු කර්මාන්ත ගණන - සමුච්චිත	291	321	336
3	උත්පාදනය කරන ලද මුළු රැකියා ප්‍රමාණය	8595	8890	9110

2023–2025 කාලපරිච්ඡේදය තුළ කාර්මික කාර්මික ජනපදවල කාර්යසාධනය විශ්ලේෂණය කිරීමේදී, ක්‍රියාත්මක කාර්මික ජනපද සංඛ්‍යාව 19ක් ලෙස වර්ධනය වී ඇති අතර කාර්මික ක්‍රියාකාරකම් සහ රැකියා අවස්ථා ක්‍රමයෙන් පුළුල් වී ඇති බව පෙන්නුම් කරයි. වාණිජ නිෂ්පාදනයේ නිරත වූ සමුච්චිත කර්මාන්ත සංඛ්‍යාව 2023 වර්ෂයේ 291 සිට 2025 වර්ෂයේ 336 දක්වා ඉහළ ගොස් ඇති අතර, එය සමස්තයක් ලෙස ආසන්න වශයෙන් 15.5%ක වර්ධනයක් නියෝජනය කරයි. මෙම කාලපරිච්ඡේදය තුළ සමස්ත රැකියා අවස්ථා සංඛ්‍යාව 8,595 සිට 9,110 දක්වා ඉහළ ගොස් ඇති අතර, එමගින් කාර්මික ජනපදවල ක්‍රියාකාරකම් වර්ධනය වීමත් සමඟ රැකියා උත්පාදනයේ ද ක්‍රමික වර්ධනයක් සිදුව ඇති බව පැහැදිලි වේ.මෙය කාර්මික කලාපවල පවතින පහසුකම් වඩාත් ඵලදායී ලෙස භාවිතයට ගැනීම සහ පෞද්ගලික අංශයේ සහභාගීත්වය වර්ධනය වීම පිළිබිඹු කරයි.

2.4 මූල්‍ය පහසුකම් සපයන ලද කර්මාන්ත සහ ව්‍යවසායන් පිලිබඳ තොරතුරු

වගුව 2.4 : මූල්‍ය පහසුකම් සැපයීමට අදාල ප්‍රගතිය

	මූල්‍ය පහසුකම් සපයන ලද කර්මාන්ත සහ ව්‍යවසායන්	2023	2024	2025
1	කර්මාන්ත සංවර්ධන අරමුදල	33	86	82
2	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා අනෙකුත් මූල්‍ය ආධාර	930	534	471
	එකතුව	**963**	**620**	**553**

SMEs සඳහා ලබා දෙන මූල්‍ය සහාය ද මෙම කාලපරිච්ඡේදය තුළ පහත වැටීමක් පෙන්නුම් කර ඇති අතර, මූල්‍ය සහාය ලබාගත් ව්‍යවසායන් සංඛ්‍යාව 2023 වර්ෂයේ 963 සිට 2025 වර්ෂයේ 553 දක්වා අඩු වී ඇත. කාර්මික සංවර්ධන අරමුදල (Industry Development Fund) හරහා ලබා දුන් මූල්‍ය සහාය ලබාගත් ව්‍යවසායන් සංඛ්‍යාව 2023 වර්ෂයේ 33 සිට 2024 වර්ෂයේ 86 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර, 2025 වර්ෂයේදී එය සුළු වශයෙන් පහත වැටී 82ක් බවට පත්ව ඇත. අනෙකුත් මූල්‍ය සහාය ලබාගත් SMEs සංඛ්‍යාව 2023 වර්ෂයේ 930 සිට 2025 වර්ෂයේ 471 දක්වා අඩු වී ඇත. මෙම ප්‍රවණතාව මගින් විශේෂයෙන් නව ආයෝජන සඳහා පහසුකම් සැලසීම, තාක්ෂණික නවීකරණය, ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ කුඩා පරිමාණ ව්‍යවසායන් මධ්‍ය පරිමාණ කර්මාන්ත බවට පරිවර්තනය කිරීම සඳහා මූල්‍ය සහාය යාන්ත්‍රණ තවදුරටත් ශක්තිමත් කිරීම හා පුළුල් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරයි.

2.5 කර්මාන්ත සඳහා සපයන ලද පුහුණු අවස්ථා

වගුව 2.5 : පුහුණු වැඩසටහන් පිලිබඳ සාරාංශය

මානව සම්පත් සංවර්ධනය (ලබා දී ඇති පුහුණු අවස්ථා ගණන)	2021	2022	2023	2024	2025
1. කුසලතාව සහ ධාරිතාව ගොඩනැගීම - තාක්ෂණය සම්බන්ධ නොවන					
1.1 වැඩසටහන් ගණන	13	47	397	246	125
1.2 පුහුණුව ලද සංඛ්‍යාව	759	2,573	14,618	4,924	4,287
2. කුසලතාව සහ ධාරිතාව ගොඩනැගීම - තාක්ෂණය සම්බන්ධ වන					
1.1 වැඩසටහන් ගණන	68	171	1,003	787	633
1.2 පුහුණුව ලද සංඛ්‍යාව	1,060	3,082	21,843	12,081	15,529
වැඩසටහන්වල මුළු එකතුව	**81**	**218**	**1,400**	**1,033**	**758**
පුහුණුවීම් වල මුළු එකතුව	**1,819**	**5,655**	**36,461**	**17,005**	**19,816**



2021–2025 කාලපරිච්ඡේදය තුළ කාර්මික සංවර්ධන මණ්ඩලයේ (IDB) පුහුණු ක්‍රියාකාරකම් සැලකිය යුතු ලෙස පුළුල් වී ඇත. පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 2021 වර්ෂයේ 81 සිට 2023 වර්ෂයේ 1,400 දක්වා සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති අතර, 2025 වර්ෂයේදී එය 758 දක්වා අඩු වී ඇත. එමෙන්ම, පුහුණු වැඩසටහන්වල ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2021 වර්ෂයේ 1,819 සිට 2023 වර්ෂයේ 36,461 දක්වා ඉහළ ගොස් ඇති අතර, 2025 වර්ෂයේදී 19,816ක් ලෙස වාර්තා වී ඇත. 2025 වර්ෂයේදී තාක්ෂණය සම්බන්ධ පුහුණු වැඩසටහන් ප්‍රමුඛ පුහුණු ක්ෂේත්‍රය බවට පත්ව ඇති අතර, වැඩසටහන් 633ක් මඟින් ප්‍රතිලාභීන් 15,529 දෙනෙකු වෙත පුහුණුව ලබා දී ඇත. මෙය කර්මාන්ත ක්ෂේත්‍රයේ තාක්ෂණික යෙදවුම්, නවීන කුසලතා සහ තාක්ෂණික ධාරිතා සංවර්ධනය කෙරෙහි අප ආයතනය විසින් වැඩි අවධානයක් යොමු කර ඇත. සමස්තයක් ලෙස, මෙම ප්‍රවණතාව මඟින් කාර්මික මානව සම්පත් සංවර්ධනය සඳහා IDB හි දායකත්වය ශක්තිමත් වී ඇති බව පැහැදිලි වන අතර, ඉදිරියේදී පුහුණු වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම, කර්මාන්ත ක්ෂේත්‍රයේ සහභාගීත්වය තවදුරටත් පුළුල් කිරීම සහ නැගී එන කාර්මික කුසලතා අවශ්‍යතා සමඟ පුහුණු වැඩසටහන් වඩාත් සමීපව ගැළපීම අවශ්‍ය වේ.

පස් අවුරුදු සමස්ත ප්‍රවණතාව අනුව, කාර්මික මානව සම්පත් සංවර්ධනය සඳහා IDB හි දායකත්වය සැලකිය යුතු ලෙස ශක්තිමත් වී ඇති අතර, තාක්ෂණය කේන්ද්‍ර කරගත් කුසලතා සහ ධාරිතා සංවර්ධනය වෙත පැහැදිලි මාරුවක් සිදුවී ඇත. 2023 වර්ෂයේ ඉහළම මට්ටමට පසුව පුහුණු වැඩසටහන් සහ ප්‍රතිලාභීන් සංඛ්‍යාවේ යම් උච්චාවචනයක් පැවතියද, 2025 වර්ෂයේදී ද සැලකිය යුතු කර්මාන්ත සහභාගීත්වයක් සහිතව පුහුණු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත. ඉදිරියේදී පුහුණු වැඩසටහන් අඛණ්ඩව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින හා මතුවෙමින් පවතින කුසලතා හිඟයන් හඳුනාගෙන ඒවාට ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රතිඵල මත පදනම් වූ පුහුණු ක්‍රමවේද තවදුරටත් ශක්තිමත් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. එමඟින් කාර්මික ඵලදායිතාව, නවෝත්පාදනය, තාක්ෂණය භාවිතයට ගැනීම සහ කර්මාන්තවල සමස්ත තරගකාරීත්වය තවදුරටත් වැඩිදියුණු කිරීමට හැකි වනු ඇත.

3) ආයතනය මුහුණදෙන ඉදිරි අභියෝග සහ යෝජිත ක්‍රියාමාර්ග

වගුව 3.1 : ඉදිරි අභියෝග සහ යෝජිත ක්‍රියාමාර්ග පිලිබඳ සාරාංශය

ප්‍රධාන අභියෝග	වැඩිදියුණු කිරීම සඳහා යෝජිත ක්‍රියාමාර්ග
1. සංවර්ධන කටයුතු සඳහා සීමිත මූල්‍ය සම්පත් – පුනරාවර්තන වියදම් ඉහළ යාම සහ සංවර්ධන කටයුතු සඳහා වෙන්වන සීමිත ප්‍රතිපාදන හේතුවෙන් යටිතල පහසුකම් නවීකරණය, තාක්ෂණික නවීකරණය, කාර්මික ජනපද සංවර්ධනය, තාක්ෂණික සේවා සහ නව සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කළ හැකි සම්පත් සීමා වී ඇත.	මූල්‍ය තිරසාරභාවය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තරව උපයා ගන්නා ආදායම් වැඩිදියුණු කිරීම, සුදුසු අවස්ථාවල පිරිවැය ප්‍රතිසාධන යාන්ත්‍රණ හඳුන්වා දීම, ඉහළ බලපෑමක් ඇති ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය ලබා දීම සහ උපායමාර්ගික කාර්මික සංවර්ධන වැඩසටහන් සඳහා මහා භාණ්ඩාගාරය, දායක ආයතන සහ සංවර්ධන හවුල්කරුවන්ගෙන් මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම.
2. පැරණි යටිතල පහසුකම් සහ තාක්ෂණික පහසුකම් – IDB කාර්මික ජනපද, වැඩමුළු, රසායනාගාර, පුහුණු පහසුකම් සහ අනෙකුත් තාක්ෂණික යටිතල පහසුකම් කිහිපයක් වර්තමාන කාර්මික අවශ්‍යතා සපුරාලීම සඳහා නවීකරණය කිරීම අවශ්‍ය වේ.	IDB යටිතල පහසුකම් අදියරෙන් අදියර නවීකරණය කිරීම සඳහා කර්මාන්තයේ ඉල්ලුම සහ ආර්ථික බලපෑම මත පදනම්ව කාර්මික ජනපද, තාක්ෂණික රසායනාගාර, යන්ත්‍රෝපකරණ වැඩමුළු, පුහුණු මධ්‍යස්ථාන සහ පහසුකම් සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.
3. සීමිත තාක්ෂණික නවීකරණය සහ Industry 5.0 සඳහා සූදානම් වීම ප්‍රමාණවත් නොවීම – විශේෂයෙන් MSMEs ඇතුළු බොහෝ දේශීය කර්මාන්තවලට නවීන යන්ත්‍රෝපකරණ, ස්වයංක්‍රියකරණ තාක්ෂණය, ඩිජිටල් තාක්ෂණය, නිෂ්පාදන සංවර්ධන පහසුකම් සහ උසස් නිෂ්පාදන හැකියාවන් සඳහා ප්‍රවේශය සීමා වී ඇත.	තාක්ෂණ හා නවෝත්පාදන සහාය පහසුකම් ස්ථාපිත කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා Component, Product Development and Tooling (CPT) Centre, ස්වයංක්‍රියකරණ හා ඩිජිටල් නිෂ්පාදන සේවා, තාක්ෂණ හුවමාරු වැඩසටහන් සහ කර්මාන්ත–පර්යේෂණ ආයතන සහයෝගිතා ඇතුළු පහසුකම් සංවර්ධනය කිරීම.
4. මානව සම්පත් සහ ආයතනික ධාරිතාවේ හිඩැස් – තාක්ෂණික, වෘත්තීය, කළමනාකරණ සහ ක්ෂේත්‍ර මට්ටමේ කාර්ය මණ්ඩල පුරප්පාඩු සහ හිඟය හේතුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ විශේෂිත සේවා කාලෝචිතව සැපයීම කෙරෙහි බලපෑම් ඇති වේ.	ව්‍යුහගත මානව සම්පත් ශක්තිමත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මඟින් ප්‍රමුඛතා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම, අනුප්‍රාප්තික සැලසුම්කරණය, වෘත්තීය සංවර්ධනය, තාක්ෂණික පුහුණුව සහ නව කාර්මික තාක්ෂණ, ඩිජිටල්කරණය, අපනයන සංවර්ධනය සහ ව්‍යාපෘති කළමනාකරණය සම්බන්ධ අඛණ්ඩ කුසලතා සංවර්ධනය ශක්තිමත් කිරීම.
5. කාර්මික ජනපදවල මූල්‍ය හා මෙහෙයුම් තිරසාරභාවය – කාර්මික කලාප සඳහා අඛණ්ඩ යටිතල පහසුකම් නඩත්තුව, නවීකරණය සහ කාර්යක්ෂම භාවිතය අවශ්‍ය වන අතර, ඉඩම් ලබාගැනීමේ හැකියාව සහ අත්පත් කර ගැනීමේ ක්‍රියාවලීන් තවදුරටත් පුළුල් වීම සීමා කළ හැකිය.	සමස්ත කාර්මික කලාප සංවර්ධන හා කළමනාකරණ රාමුවක් සකස් කිරීම මඟින් එක් එක් කාර්මික කලාපය සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කිරීම, යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය, ඉඩම් හා පහසුකම් භාවිතය සහ ඉඩම් තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම සහ සුදුසු පෞද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා යාන්ත්‍රණ හඳුන්වා දීම.
6. දේශීය කර්මාන්ත අපනයන හා ගෝලීය අගය දාමයන්ට සීමිත ලෙස ඒකාබද්ධ වීම – අපනයන සඳහා සූදානම් වීම, ජාත්‍යන්තර සහතික ලබා ගැනීම, සන්නාමකරණය, වෙළඳපොළ තොරතුරු ලබා ගැනීම සහ තිරසාර ජාත්‍යන්තර ව්‍යාපාරික සබඳතා ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් දේශීය ව්‍යවසායන් තවදුරටත් අභියෝගවලට මුහුණ දෙයි.	අපනයන කේන්ද්‍රගත කාර්මික සංවර්ධනය ශක්තිමත් කිරීම සඳහා ඉලක්කගත අපනයන සූදානම් කිරීමේ වැඩසටහන්, ජාත්‍යන්තර සහතික ලබා ගැනීම සඳහා සහාය, නිෂ්පාදන සන්නාමකරණය හා ඇසුරුම්කරණය, වෙළඳපොළ තොරතුරු, වෙළඳ දූත කණ්ඩායම් සහ වෙළඳ ප්‍රවර්ධන ආයතන සමඟ ශක්තිමත් සහයෝගිතාව ක්‍රියාත්මක කිරීම.

ප්‍රධාන අභියෝග	වැඩිදියුණු කිරීම සඳහා යෝජිත ක්‍රියාමාර්ග
7. පෞද්ගලික අංශය, අධ්‍යයන ආයතන සහ පර්යේෂණ ආයතන සමඟ සීමිත සහයෝගිතාව – තාක්ෂණ හුවමාරුව, නවෝත්පාදනය, වාණිජකරණය, නිෂ්පාදන සංවර්ධනය සහ කර්මාන්ත පාදක පර්යේෂණ සඳහා පවතින අවස්ථා ශක්තිමත් ආයතනික හවුල්කාරිත්වයන් මඟින් තවදුරටත් පුළුල් කළ හැකිය.	රාජ්‍ය–පෞද්ගලික–අධ්‍යයන හවුල්කාරිත්වයන් පුළුල් කිරීම සඳහා විශාල පරිමාණ කර්මාන්ත, විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන, වාණිජ මණ්ඩල, ජාත්‍යන්තර සංවිධාන සහ තාක්ෂණික සේවා සපයන්නන් සමඟ ව්‍යුහගත සහයෝගිතා වැඩසටහන් සංවර්ධනය කිරීම.
8. IDB සේවා පිළිබඳ සීමිත දැනුවත්භාවය සහ ප්‍රවේශය – IDB මඟින් පුළුල් පරාසයක සේවා සපයනු ලැබුවද, විශේෂයෙන් ප්‍රාදේශීය මට්ටමේ ඇතැම් ව්‍යවසායකයන් සහ කර්මාන්තකරුවන්ට පවතින තාක්ෂණික, පුහුණු, ව්‍යාපාර සංවර්ධන සහ කාර්මික සහාය සේවා පිළිබඳ ප්‍රමාණවත් දැනුවත්භාවයක් නොමැති විය වීම.	ඩිජිටල් සහ ප්‍රාදේශීය ප්‍රවේශ වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ මාර්ගගත සේවා වේදිකා, ඉලක්කගත දැනුවත් කිරීමේ වැඩසටහන්, දිස්ත්‍රික් මට්ටමේ කර්මාන්ත දැනුවත් කිරීම්, කර්මාන්ත දත්ත සමුදා සහ IDB සේවා පිළිබඳ වැඩිදියුණු කළ සන්නිවේදන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම.
9. ප්‍රතිඵල මත පදනම් වූ අධීක්ෂණ හා ඇගයීම් ක්‍රමවේදයේ දුර්වලතා – සාම්ප්‍රදායිකව වැඩසටහන් අධීක්ෂණය ක්‍රියාකාරකම් සහ නිමැවුම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇති අතර, ඵලදායිතාව වැඩිදියුණු කිරීම, ව්‍යවසාය වර්ධනය, රැකියා, ආයෝජන සහ අපනයන කාර්යසාධනය වැනි ප්‍රතිඵල ක්‍රමානුකූලව මැනීම තවදුරටත් ශක්තිමත් කළ යුතුය.	ඒකාබද්ධ කාර්යසාධන හා අධීක්ෂණ සහ ඇගයීම් (M&E) රාමුවක් ස්ථාපිත කිරීම මඟින් මැනිය හැකි ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs), ප්‍රතිඵල දර්ශක සහ ඩිජිටල් ඩෑෂ්බෝඩ් හඳුන්වා දී ව්‍යවසාය සංවර්ධනය, තාක්ෂණය භාවිතයට ගැනීම, රැකියා, ආයෝජන, අපනයන, ආදායම් උත්පාදනය සහ කාර්මික කලාප කාර්යසාධනය අධීක්ෂණය කිරීම.
10. ආයතනික පරිවර්තනය සහ සේවා නවීකරණයේ අවශ්‍යතාව – ශ්‍රී ලංකා කර්මාන්ත ක්ෂේත්‍රයේ වෙනස් වෙමින් පවතින අවශ්‍යතා හේතුවෙන් සාම්ප්‍රදායික සහාය ප්‍රවේශයන්ගෙන් ඔබ්බට ගොස් වඩාත් ප්‍රතිචාරාත්මක, තාක්ෂණය මත පදනම් වූ සහ ප්‍රතිඵල කේන්ද්‍රගත ආයතනික ආකෘතියක් කරා IDB පරිවර්තනය වීම අවශ්‍ය වේ.	ආයතනික පරිවර්තනය වේගවත් කිරීම සඳහා ඩිජිටල්කරණය, ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය, කාර්යසාධන කළමනාකරණය, පාරිභෝගික කේන්ද්‍රගත සේවා සැපයීම, උපායමාර්ගික සැලසුම්කරණය සහ IDB හි ප්‍රමුඛ කාර්මික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.